# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2148/23 - 2019 නොවැම්බර් මස 06 වැනි බදාදා - 2019.11.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/2005

**2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත**

8(1) වන වගන්තිය යටතේ වූ නියමය

2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනතේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය තලතා අතුකෝරල වන මා විසින්, එකී වගන්තියේ කාර්යය සඳහා, මෙහි උපලේඛනයේ I වන තීරුවේ දක්වා ඇති ආරවුල් වර්ගයට අයත් ආරවුලක් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ මෙහි උපලේඛනයේ II වන තීරුවේ සඳහන් විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ උද්ගත වන විටෙක එම ආරවුලෙහි විෂය වස්තුවේ මුල්‍ය වටිනාකම, උපලේඛනයේ III තීරුවේ අනුරූපව දක්වා ඇති වටිනාකම විය යුතු බවට මෙම නියමය මඟින් නිශ්චිතව සඳහන් කරනු ලැබේ.

තලතා අතුකෝරල,
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

| I වන තීරුව<br>*ආරවුල් වර්ගය* | II වන තීරුව<br>*විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය* | III වන තීරුව<br>*පහත සඳහන් මුල්‍ය වටිනාකමට අඩු මුල්‍ය වටිනාකමක දී සමථකරණයට යොමුකිරීම අනිවාර්ය වේ* |
|---|---|---|
| විදේශගත ශ්‍රමිකයන් හා ඔවුන්ගේ ශ්‍රී ලංකාව තුළ පදිංචිව සිටින පවුලේ සාමාජිකයන්ගේ දුක්ගැනවිලි සම්බන්ධව වන ආරවුල් | කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කය | රුපියල් මිලියනයයි |

11-1328